## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
## (SLBFE)

# ප්‍රසම්පාදන දැන්වීම

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිලඇඳුම්/ නිලඇඳුම් රෙදි ප්‍රසම්පාදනය

### (ලංසු අංක : PR/02/11-1(2))

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිලඇඳුම්/ නිලඇඳුම් රෙදි සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් සැපයුම් කරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ. අවශ්‍යතා උපලේඛනය පිළිබඳ විස්තරාත්මක සටහන ලංසුලේඛනයේ දක්වා ඇත. සාරි, කමිස හා කලිසම් වල වර්ණය සහ රෙදි වර්ගය ලංසු ලේඛනයෙහි දී ඇති පිරිවිතරයන් හා ගැලපෙන කාර්යාල ඇඳුම් සඳහා සුදුසු විය යුතු අතර, සාරි මෝස්තර සැපයුම්කරු විසින් ලබා දිය යුතුය.

| | විස්තරය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 1 | කලිසම් රෙදි | මීටර් 2215 |
| 2 | කමිස - අත්දිග | 1704 |
| 3 | කමිස - අත්කොට | 954 |
| 4 | සාරි | 3480 |
| ප්‍රමාණයන් අඩු වැඩි වීමට ඉඩ ඇත | | |

01. මෙම ප්‍රසම්පාදනය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි පැහැදිළි කොට ඇති පරිදි හා ලංසුකරණ ලිපිලේඛන වල දක්වා ඇති සුදුසුකම් අවශ්‍යතාවයන් සපුරාලන සියලුම යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන්ට විවෘතය.

02. අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, නො. 234, 2 වන මහල හි ප්‍රසම්පාදන කළමනාකරු වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගත හැකි අතර, 2023-11-13 දින සිට 2023-12-04 දින දක්වා වි.සේ.නි. කාර්යාංශයේ ඉහත කාර්යාලයේදී ලංසුලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථනය : 011-2887585, ඊමේල් : mgr_procurement@slbfe.lk

03. 2023-11-13 දින සිට 2023-12-04 දින දක්වා ලංසුකරණයෙහි යෙදෙන ආයතනයේ ලිඛිත ඉල්ලීමක් හා ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක්, ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 12,500.00 ක ගාස්තුවක් අයකැමි වෙත ගෙවීමෙන් අනතුරුව ලබා ගත හැකි ලංසු ලේඛනය මගින් ලංසු ඉදිරිපත් කළ හැකිය.

04. ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කරන ලද, පිළිගත් වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද රුපියල් පන් ලක්ෂයක (රු. 500,000/-) වටිනාකමකින් යුත් "ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිතුමාගේ නමින්" ලබාගත් ලංසු බැඳුම්කරයක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතු වන අතර, එකී ලංසු සුරැකුම ලංසු විවෘත කළ දින සිට දින එකසිය දහනවයක් (119) දක්වා වලංගුව පැවතිය යුතුය. සාර්ථක ලංසුකරු සම්පූර්ණ ලංසු වටිනාකමින් 10% ක කාර්යසාධන බැඳුම්කරය ඉදිරිපත් කළ යුතුය.

06. ලංසුලේඛන ඇතුළත් ලංසු බහාලන මුද්‍රා, තැබූ කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"වි.සේ.නි. කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම්/ නිල ඇඳුම් රෙදි සැපයීම - PR/02/11-(2)"** යනුවෙන් සඳහන් කොට 2023-12-04 දින පෙ.ව. 10.00 ට පෙර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, 2 වන මහල, ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක (01) හි තැන්පත් කළ යුතුය. විද්‍යුත් මාර්ගයෙන් එවනු ලබන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ප්‍රමාද ලංසු භාර නොගැනේ. ලැබී ඇති සියලුම ලංසු භාරගැනීම අවසන් වූ විගස එම ලිපිනයේදීම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

**2023-11-24 දින පෙ.ව. 10.00 ට පැවැත්වීමට නියමිත පූර්ව-ලංසු රැස්වීම පහත ලිපිනයේ 2 වන මහලේ පිහිටි රැස්වීම් කාමරයේදී පැවැත්වේ.**

කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුවන අතර, ලංසු ලිපි ලේඛන පිළියෙළ කිරීමෙහි හෝ ඉදිරිපත් කිරීමෙහි ලා ලංසුකරුවන් ඍජුව හෝ වක්‍රව දරනු ලබන කිසිදු වියදමක් ආපසු ගෙවනු නොලැබේ.


**සභාපති, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**නො.334, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**
**දුරකථන/ ෆැක්ස් : 0112-880550/ 2880564/2887585**
**ඊමේල් : mgr.procurement@slbfe.lk**


**"එතෙර සවියට මෙතෙර අත්වැල"**